රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2021

මගේ අංකය : EST-4/04/MNT/4604
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.03.19

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## භාෂා පරිවර්තක සංචිතයක් පිහිටුවීම

රාජ්‍ය සේවය තුළ පවතින ප්‍රවීණ භාෂා පරිවර්තකයින්ගේ උග්‍ර හිඟය සැලකිල්ලටගෙන 2019.01.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී භාෂා පරිවර්තක සේවයේ නව සේවා ව්‍යවස්ථාව අනුමත කර බඳවාගැනීම් සිදු කරන තෙක් රජයේ විශ්වවිද්‍යාලවල භාෂා පරිවර්තන ක්‍රම/ වාග් විද්‍යාව හදාරනු ලැබ ඇති උපාධිධාරීන්, භාෂා පරිවර්තක සේවයෙහි යෝග්‍ය තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනීමට තීරණය කර ඇත.

02. දැනට භාෂා පරිවර්තක සේවයේ ස්ථිර නිලධරයන්ගේ සේවය ලබා ගැනීමට අපහසුවන අවස්ථාවල දී සහ ආයතනය තුළ භාෂා පරිවර්තක සේවයේ අනුමත තනතුරුවල පුරප්පාඩු පවතින අවස්ථාවල දී පමණක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් භාෂා පරිවර්තකයින්ගේ සංචිතයක් පවත්වාගැනීමේ ක්‍රමවේදය අනුගමනය කර රාජකාරී ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු අතර එහි දී දැනට අත්‍යාවශ්‍යව පවතින සිංහල/දෙමළ භාෂා පරිවර්තකයින් බඳවාගැනීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු බව ද අවධාරණය කෙරේ.

03. ආයතනය තුළ අනුමත තනතුරුවල පුරප්පාඩු නොමැති නම් අවශ්‍යතාව මත භාෂා පරිවර්තක සේවයේ නව තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමට අනුමත කරවා ගැනීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතු ය.

04. මෙම භාෂා පරිවර්තක සංචිතයෙහි ඇතුළත්ව සිටින පුද්ගලයින්ගේ සේවය ලබාගැනීමේ දී අදාළ කර ගත යුතු ගාස්තු ප්‍රමාණයන් පහත පරිදි වේ.

I. දෛනිකව සේවය ලබා ගන්නේ නම් පැය 08ක සේවා කාලයක් වෙනුවෙන් රුපියල් 1000/-ක් (රුපියල් දහසක්) ගෙවීම.

II. කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගන්නේ නම් මාසිකව රුපියල් 30,000/-ක් (රුපියල් තිස් දහසක්) ගෙවීම.

III. පරිවර්තනය සඳහා වූ යතුරු ලියන/ පරිගණකයේ මුද්‍රණය කිරීම වෙනුවෙන්, 2016.08.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003(III)හි 04 ඡේදයේ විධිවිධාන අනුව ගෙවීම.

05. මෙම ක්‍රමවේදය යටතේ භාෂා පරිවර්තක නිලධරයන්ගේ සේවාව ලබා ගන්නා ආයතන ප්‍රධානීන් විසින් ඔවුන්ගේ සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳව රාජ්‍ය සේවා විෂයභාර ලේකම් වෙත ත්‍රෛමාසිකව වාර්තා කළ යුතු ය.

06. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.



ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය